# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය දරන තනතුරු වන අතර, ස්ථානමාරු විෂය රහිත වේ.

## 01. අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර : (පුරප්පාඩු ගණන 01 යි)

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණ / සංවර්ධන / සමාජ විද්‍යා විෂයය ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම සමග

කළමනාකරණ / සංවර්ධන / සමාජවිද්‍යා විෂයය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

රජයේ, අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක මානව සම්පත් පිළිබඳ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර පහළොවක (15) සේවා පළපුරුද්ද.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ චක්‍රලේඛ 02/2016 පරිදි HM 1-1 2016 රු. (81,670 - 15x2,270 - 115,720) වැටුප් පරිමාණයේ 2020.01.01 දිනට හිමි වැටුප් පියවර වන රු. 81,670/- හා අනුමත දීමනා

**බඳවාගැනීමේ ක්‍රමය :**

පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 02. වෛද්‍ය නිලධාරී තනතුර : (පුරප්පාඩු ගණන 04 යි)

i. **වෛද්‍ය නිලධාරී (තත්ව කළමනාකරණය) - 02**
ii. **වෛද්‍ය නිලධාරී (සැලසුම්කරණය) - 02**

**සුදුසුකම් :**

ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක වෛද්‍ය පීඨයකින් පිරිනමන ලද ප්‍රථම හෝ ඊට ඉහළ හෝ වෛද්‍ය උපාධියක් සහිතව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගත් රෝහලක වසරක අනිවාර්ය සීමාවාසික පුහුණුවක් සහිතව වෛද්‍යවරයෙක් ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ චක්‍රලේඛ 02/2016 පරිදි MM 1-3-2016 (55,925 - 10x1,375, - 15x1,910 - 98,325) වැටුප් පරිමාණයේ 2020.01.01 දිනට හිමි වැටුප් පියවර වන රු. 55,925/- හා අනුමත දීමනා.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

විවෘත තරග විභාගයක් හා/හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

විවෘත තරග විභාගය සඳහා වන විෂය නිර්දේශය

(අ) භාෂා ප්‍රවීණතාව
(ආ) අභියෝගතා පරීක්ෂණය

(අ) **භාෂා ප්‍රවීණතාව** : ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ රීති භාවිතය පිළිබඳ අපේක්ෂකයාගේ හැකියාවන් මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

(ආ) **අභියෝගතා පරීක්ෂණය** : තනතුරට අදාළ කාර්යයන් මනාව ඉටු කිරීමෙහිලා අපේක්ෂකයාගේ අභියෝගතාව සහ හැකියාව මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

## වෙනත් කරුණු :

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2020.10.03 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ප්‍රධාන විධායක නිලධාරී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය

**.................................. තනතුර සඳහා අයදුම්පත**

01. සම්පූර්ණ නම : ____________________
02. මුලකුරු සමග නම : ____________________
03. ලිපිනය : ____________________
04. පදිංචි දිස්ත්‍රික්කය : ____________________
05. උපන් දිනය : ____________________
06. වයස : අවු : __________ මාස : __________ දින : __________
07. ස්ත්‍රී / පුරුෂ භාවය : ____________________
08. ජාතික හැඳුනුම්පත් අංකය : ____________________
09. විභාගයට පෙනී සිටින මාධ්‍යය : ____________________
10. දුරකතන අංකය : ස්ථාවර : __________ ජංගම : __________
11. විද්‍යුත් තැපැල : ____________________
12. අධ්‍යාපන සුදුසුකම් : ____________________
13. වෘත්තීය සුදුසුකම් : ____________________
14. පළපුරුද්ද : ____________________
15. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, දුරකතන අංක හා ලිපිනයන් :

මෙහි ඉහතින් දක්වා ඇති මා පිළිබඳ තොරතුරු මාගේ දැනීම, විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය : ....................

..............................
(ඉල්ලුම්කරුගේ අත්සන)

**සැලකිය යුතුයි :**

අදාළ ආකෘතියට අනුව පමණක් අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවිය යුතු අතර, ඔබගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍රවල පිටපත් අයදුම්පත්‍රය සමග යොමු කළ යුතු වේ.